# යෝධ යහළුවා



පී. තිනුලි ධීෂණා දෙහිගොල්ල

# යෝධ යහළුවා

පී. තිනුලි ධීෂණා දෙහිගොල්ල

5B

යෝධ යහළුවා


පී. තිනුලි ධීෂණා දෙහිගොල්ල

කතෘ සතුයි.

මහාමායා බාලිකා විදුහල - මහනුවර


2025.02.08

කතෘගේ වෙනත් කෘති

- ගිරා රංචුව
- පනින්න පෙර සිතා බලමු


ISBN – 978-624-208-568-5

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක මායා කියලා පුංචි ගැහැනු ළමයෙක් හිටියා.එයා ජීවත් වුණේ එයාගේ අම්මයි තාත්තායි බලුපැටියයි එක්ක.



මායාට හෙන්රියි ,හිල්ඩයි නමින් හොඳ යහළුවෝ දෙන්නෙක් හිටියා .මායාගේ බලු පැටියාගේ නම තමයි ටොමී. මායායි, එයාගේ යහළුවොයි ,බලු පැටියයි දවසක් සෙල්ලම් කරද්දි බෝලය ලොකු ගෙදරක ජනේලයකින් ඇතුළට ගියා.



ඒ ගෙදර අයිතිකාරයා යෝධයෙක්. එයාලා ඒ ගැන දන්නේ නැති නිසා ගෙදරට යන්න තීරණය කළා. ලොකු තාප්පයෙන් පිටතට වැටිලා තිබුණ අත්තෙන් ගෙදරට යන්න පුළුවන් වෙයි කියලා හෙන්රි හිතුවා. හෙන්රි ඒ ගැන මායාටයි, හිල්ඩාටයි කිව්වා. “මේ අහන්න අපි  මේ අත්තෙන් එහා වත්තට යමු. මම මුලින් ම අත්තට නගින්නම්.

ඊට පස්සේ ටොමීව මට දෙන්න.ඊළඟට ඔයාලා නගින්න.” හෙන්රි කියපු විදිහට යහළුවෝ ගෙදරට ගියා.



එයාලා දැක්කා කෑම මේසයක් තියෙනවා.කෑම මේසයේ උඩ කෑම ගොඩක් තිබුණා.



එයාලා ඒ කෑම කන්න පටන් ගත්තා. ඒත් එක්කම යෝධයත් නැඟිටලා එන සද්දේ ඇහුණා. යාළුවෝ ඉක්මනට ගිහින් අල්මාරියක් පිටිපස්සේ හැංගුණා.



යෝධයා කෑම මේසය ළඟට ආවා. "කවුද මගේ කෑම ටික කෑවේ? මනුස්ස, ගමේ කෙනෙක් තමයි. මම හොඳ වැඩක් කරන්නම් ."යෝධයා ලොකු දර මිටියකට ගින්දර පත්තු කරගෙන ගෙයින් එළියට ගියා.



අල්මාරිය පිටුපස හිටපු යහළුවො ටික එළියට ආවා. “යෝධයා මොනවද දන්නෑ කරනනේ? අපි පොඩ්ඩක් බලමු.”මායා කිවුවා.යහළුවො ටික යෝධයා මොනවද කරන්නේ කියලා බැලුවා.

එක පාරටම යෝධයාගේ සපත්තුවට ගින්දර පත්තු කරපු ලී කෝටුව වැටුණා. යෝධයාගේ සපත්තුව ගිනිගත්තා.යෝධයා කෑගහගෙන දිව්වා.

එයා වතුර බාල්දියකට කකුල දැම්මා.ගිනිගන්න එක නැවතුණා.ඔහු මෙහෙම හිතුවා."දැන් මට මේ ගමේ නම් ඉන්න බෑ වගේ මම යනවා වෙන ගමකට.



මේ අතරතුර යහළුවෝ යෝධයා ළඟට ආවා. යෝධයා ඔවුන් දිහා බැලුවා. අපිට සමාවෙන්න, අපි නිසානේ මේ හැමදේ මායයි, යහළුවොයි කිව්වා. යෝධයා හිනා වුණා ඔයාලා හරිම අවංක ළමයි ඔහු කිව්වා.

ඔයාට අපි  උදව් කරනවා, කාපු කෑම ටික ආයෙමත් හදන්න.



යහළුවෝ යෝධයාට කෑම හදන්න උදව් කළා. යෝධයාට අදහස වෙනස් කරගත්තා.



මායාගෙයි යහලුවන්ගෙයි හොඳ යහළුවෙක් බවට යෝධයා පත්වුණා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN – 978-624-208-568-5